# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1851/17 - 2014 පෙබරවාරි මස 25 වැනි අඟහරුවාදා - 2014.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ මාතර මහා නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන මාතර මහා නගර සභාවේ සභික ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ගලප්පත්ති චතුර හර්ෂ කුමාර නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ මාතර මහා නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ජයවර්ධන විදාන පතිරණගේ ජනක මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

මාතර මහා නගර සභාවේ තේරීම්භාර නිලධාරි වේවැල්වල හේවගේ රවින්ද්‍ර විජය කුමාර වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ජයවර්ධන විදාන පතිරණගේ ජනක මහතා මාතර මහා නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඩබ්. එච්. ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරී,
මාතර මහා නගර සභාව.

2014 පෙබරවාරි මස 11 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මාතර.

03 - 285

1A - G 19121 — 85 (2014/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත**

10අ(1)(අ) වැනි වගන්තිය යටතේ දැන්වීම

**යාපනය මහ නගර සභාව**

යාපනය මහ නගර සභාවේ සභිකයකු වන සුදර්සිං විජයකාන්ත් මහතා, එක්සත් ජනතා නිදහස් සන්ධානය පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධූරය ඔහු විසින් අත හැර ඇති බව යාපනය මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී පොන්නුතුරෙයි කුගනාදන් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

පී. කුගනාදන්,
තේරීම්භාර නිලධාරී,
යාපනය මහ නගර සභාව.

2014 පෙබරවාරි මස 18 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
යාපනය.

03 - 286

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.